# රතු රෝසි



# රතු රෝසි



කේ ඒ තිනුති මෙතුනිජා කොස්වත්ත




# රතු රෝසි

ප්‍රථම මුද්‍රණය

2025 ජනවාරි

©
කේ ඒ තිනුති මෙතුනිජා කොස්වත්ත

ISBN : 978-624-208-309-4

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර, මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත් වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම, ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන **“ හෙරණගත්කරණි”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානවත් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමායා බාලිකා විදුහල - මහනුවර

එකමත් එක රටක හිටියා රෝසි කියලා ළමයෙක්.

එයා හරිම ලස්සනයි.

හැබැයි එයා කතා කරන්න කැමති ම නෑ.

රෝසිගෙන් කවුරු හරි දෙයක් ඇහුවොත් එයාගෙ මූණ

රතු වෙනවා.

ඒ නිසා එයාට හැමෝම කිවුවෙ රතු රෝසි කියලා.



රෝසි ජනප්‍රිය පාසලකට ගියා.

ඒත් එයාට යාළුවෝ හිටියෙ නෑ.

හැමෝම එයාට කතා කරන්න බෑ කියල හිනා වුණා.

ඒ විතරක් නෙමෙයි, මූණ රතු වුණාම උණ කියලා හිතලා

බය වෙලා දිව්වා.

මේ නිසා රෝසි හැමදාම ඇඬුවා.


මගේ මල

මේකට රෝසිගෙ අම්මයි, තාත්තයි විසඳුමක් හෙව්වා.

ඒත් හම්බවුණේ නෑ.

ඒ නිසා රෝසිව සනසන්න කියලා සීනි බෝල අරන් දුන්නා.

රෝසි ඒක කාලා හැමදාම දුකින් නින්දට ගියා.



දවසක් දා රෝසිගෙ පාසලට අලුත් ළමයෙක් ආවා.

එයා ඉඳගත්තේ රෝසි ගාව.

එයාගෙ නම බින්කි කියලා රෝසි දැන ගත්තා.

බින්කි රෝසිගෙන් ප්‍රශ්න ගොඩක් ඇහුවා.

රෝසි අමාරුවෙන් උත්තර දෙනකොට මූණ හොඳටම

රතු වුණා.

ඒ වුණාට බින්කි බය වෙලා ගියේ නැහැ.


Time

එක දවසක් බින්කි පන්තියට යද්දි , ළමයි ටික වට වෙලා ඉන්නවා දැක්කා.

බින්කිත් එයාලා ළඟට ගියා.

එතකොට තමයි බින්කි දැක්කෙ රෝසි හොඳටම අඬනවා කියලා.

රෝසි රතුම රතු වෙලා. ළමයි හැමෝම රෝසිට උසුළු විසුළු කරනවා. හිනා වෙනවා.

බින්කිටත් රෝසි ගැන විස්තර කියමින් තව තවත් හිනා වුණා. බින්කිට හොඳටම තරහ ගියා.

ඒ වුනාට එයා හරිම ඉවසීමෙන් කතා කළා.

කෙනෙකුට එහෙම උසුළු විසුළු කරමින් හිනා වෙන එක නරක දෙයක් බව කියලා දුන්නා.

හොඳ ළමයි කවදාවත් එහෙම කරන් නැහැ කියලත් කිවුවා. ඒක නරක යාළුවන්ගේ පුරුද්දක් කියලත් කිව්වා.


Exit

එහෙම කියපු බින්කි, රතු රෝසිව අතින් අල්ලගෙන

පන්තියට එක්ක ගෙන ගියා.

අනෙක් යාළුවන්ට තමන් ගැන ලැජ්ජාවක් ඇති වුණා.

එදා ඉදන් රතු රෝසියි, බින්කියි හොදම යාළුවෝ වුණා.

ඒ දෙන්න පාසලේ වැඩ හොඳින් කරමින් , හරිම සතුටින්

කාලය ගත කළා.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත්, අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගෙ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක් වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු, ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාණ සම්බන්ධිකාරක

සෙනෙවිරත්න මහලේකම්